අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
THE OFFICE ON MISSING PERSONS

# ඇබෑර්තු

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත මඟින් ස්ථාපිත කරන ලද කාර්යාලකි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා **රාජ්‍ය /අර්ධ රාජ්‍ය ආයතනයක/ සංස්ථාවක දැනටමත් සේවයේ නියුතු සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## මූල්‍ය හා ප්‍රසම්පාදන ප්‍රධානී (තනතුරු 01) HM 1-1

## Head of Finance and Procurement

**රැකියාවේ ස්වභාවය :** මූල්‍ය හා ප්‍රසම්පාදන අංශයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම, ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ අදාල උපායමාර්ගික විධි සකස් කිරීම හා සංවර්ධනය කිරීම මෙන්ම පද්ධති සහ සියලුම මූල්‍ය හා ප්‍රසම්පාදන ක්‍රියා සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මූල්‍ය/ ගිණුම්කරණය/ ව්‍යාපාර අධ්‍යනය/ වාණිජ විද්‍යාව/ කළමනාකරණ (මූල්‍ය) යන ක්ෂේත්‍රවල ප්‍රථම උපාධියක් හෝ තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාල වෙනත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය සහ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ කීර්තිමත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

**වයස :** අවු. 35 ට නොඅඩු විය යුතු අතර අවු. 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** රු. 80,295 – 15 x 2,270 – 114,345/-

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා හිමිවේ.

**සටහන** : රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් සේවයේ නියුතු ඉහත සුදුසුකම් සහිත නිලධාරීන් ස්ථාන මාරු කිරීම/ ද්විතීයනය/ කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කිරීම ද සලකා බලනු ඇත.

## කළමනාකරණ සහකාර (තනතුරු 07) MA 1-1

## Management Assistant

**රැකියාවේ ස්වභාවය :** බලයලත් නිලධාරියාගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ කාර්යයන්/ක්‍රියාකාරකම්වල රාජකාරි සහ වගකීම්වලට ඉටු කිරීම සහ සංවිධානයේ කළමණාකාර, පරිපාලන සහ විධායක ශ්‍රේණිවල රාජකාරි ඉටුකිරීමට පහසුකම් සැලසීම/සහාය වීම.

**සුදුසුකම්** : (අ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේ

(I) සිංහල / දෙමළ (II) ඉංග්‍රීසි භාෂාව (III) ගණිතය යන විෂයයන් 4 සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6කින් එක් වරකදී සමත් වීම.

**සහ**

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස්පෙළ ) විභාගයේ (පොදු ප්‍රශ්න පත්‍රය හැර) අනෙකුත් විෂයන් 03 සමත් වීම.

**වයස** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර අවු. 50 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු. 27,910 – 10 x 300 – 7 x 350 – 4 x 495 – 20 x 660 – 48,540/-

**සටහන** : රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් සේවයේ නියුතු ඉහත සුදුසුකම් සහිත නිලධාරීන් මාරු කිරීම/ ද්විතීයනය/ කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කිරීම ද සලකා බලනු ඇත.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
THE OFFICE ON MISSING PERSONS

# ඇබෑර්තු

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත මඟින් ස්ථාපිත කරන ලද කාර්යාලකි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## වින්දිත හා පවුල් සහය ප්‍රධානී (තනතුරු 01) HM 1-1

## Head of Victim and Family Support

**රැකියාවේ ස්වභාවය :** වින්දිත සහ පවුල් සහය ඒකකයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ අදාල උපායමාර්ගික චාරිත්‍ර විධි සකස්කිරිම හා විශේෂඥයන් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් සකස්කොට වැඩි දියුණු කිරීමද ඇතුලත්ව OMP ආයතනයෙහි මනෝසමාජයීය සහය සහ ප්‍රජා සේවා ක්‍රියාකාරකම් සඳහා උපායමාර්ගික සැලසුම් හා සමාලෝචන කටයුතු වල නායකත්වය දැරීම සහ එම කාර්යයන් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව / උපදේශනය හා මනෝවිද්‍යාව / දර්ශනය හා මනෝවිද්‍යාව/ සමාජ විද්‍යාව / සාමය හා ගැටුම් නිරාකරණය යන ක්ෂේත්‍රයක මූලික උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සමග රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රජයේ සේවයේ දැනටමත් ස්ථිර තනතුරුවල නියුතු අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** රු. 80,295 – 15 x 2,270 – 114,345/-

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා ද හිමිවේ.

## මණ්ඩලීය ලේකම්/ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී (තනතුරු 01) MM 1-1

## Secretary to the Board / Senior Legal Officer

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලීය ලේකම්/ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී ලෙස කටයුතු කිරීම සහ එම වගකීම් දැරීම සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වල සාමාජිකයන් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කටයුතු වල නිරත වී සිටින තැනැත්තන්ගේ මනෝ සමාජයීය අවශ්‍යතාවයන් සඳහා උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට සහය ලබාදීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් නීතිය පිළිබඳ උපාධියක් සහ දිවුරුම් දුන් නීතිඥවරයෙකු වීම සහ ඉන් අනතුරුව තනතුරට අදාල ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්ද ලබා තිබීම.

**වයස :** අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** රු.53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575/-

**ඉහත සියලුම තනතුරු සඳහා අදාළ වන කරුණු :**

- සෑම අයදුම්කරුවෙක්ම,
  - ✓ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
  - ✓ යහපත් කායික හා මානසික තත්වයෙන් යුක්ත විය යුතුය
  - ✓ දිවයිනෙහි ඕනෑම ස්ථානයක සේවය කිරීමට හැකිවිය යුතුය
  - ✓ යහපත් චරිතයකින් හෙබි විය යුතුය
- පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් වේ.
- අප විසින් සපයා ඇති අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු වූවකු නම් අදාල ආයතන හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
- අයදුම්කරුවන් විසින් එවනු ලබන අයදුම්පත් අතරින් තෝරාගත් අයදුම්කරුවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී ලබාගන්නා ඉහල ලකුණු මත තෝරා ගනු ලැබේ.

- මෙම තනතුරු ස්ථිරවන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය හිමිවේ.
- අයදුම්පත්, අදාල සහතිකවල පිටපත් සමඟ 2024 මාර්තු 28 දිනට පෙර විධායක අධ්‍යක්ෂ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 40, 03 වන මහල, බුත්ගමුව පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**නීතිඥ මහේෂ් කටුලන්ද**
**සභාපති**
**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**